සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය - 2022

10 ශ්‍රේණිය

## ක්‍රිස්තියානි ධර්මය - I

කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01 ''එම්මානුවෙල්'' යන නාමයේ අර්ථය වූයේ,
(1) දෙවියන්වහන්සේ මුදන සේකය යන්නයි
(2) දෙවියන්වහන්සේ අප සමගය යන්නයි.
(3) දෙවියන්වහන්සේ ඇසූ සේකය යන්නයි
(4) දෙවියන්වහන්සේ වැඩිය සේක යන්නයි

02 දෙවියන්වහන්සේගේ පණිවිඩය ජනතාවට ගෙන යනු ලබන්නේ,
(1) පරිසිවරුන් ය. (2) සද්දුසිවරුන් ය
(3) දිවැසිවරුන් ය. (4) රජවරුන් ය

03 ''වනාන්තරයේ සමිඳුන්හට මාවතක් එළි කරන්න.'' යනුවෙන් පැවසූ දිවැසිවරයා වූයේ,
(1) මලාකි ය. (2) මීකා ය. (3) ආමෝස් ය. (4) යෙසායා ය.

04 ''සතුට සහ සොම්නස ඔබට ඇතිවේ. බොහෝ දෙනා ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීතිවන්නා හ.'' මෙයින් කියවෙන්නේ,
(1) ස්නාවක ජොහාන්ගේ උපත පිළිබඳව ය. (2) මෝසෙස්ගේ උපත පිළිබඳව ය.
(3) ජේසුස් වහන්සේගේ උපත පිළිබඳව ය. (4) පාවුල්ගේ උපත පිළිබඳව ය.

05 ජේසුස්වහන්සේගේ උපත සම්බන්ධව ශුද්ධ වූ මතෙව් ශුභාරංචියේ දැක්වෙන සංකේත වන්නේ,
(1) තරුව හා ශාස්තවන්තයින් ය. (2) තරුව හා එඬේරුන් ය.
(3) එඬේරුන් හා ශාස්තවන්තයින් ය. (4) එඬේරුන් හා ගවලෙන ය.

06 ''මෙහෙසුරු දිවැසිවර'' යනුවෙන් හඳුන්වනු ලැබුයේ
(1) ජෝසෙප් තුමා ය. (2) සෙකරියස් පූජකතුමා ය.
(3) සිමියොන් තුමා ය. (4) ස්නාවන ජොහාන්තුමා ය.

07 ''මා පියාණන්ගේ මැඳුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?'' ජේසුතුමාගේ මෙම ප්‍රකාශයෙන් අපට ලැබෙන මඟපෙන්වීම වන්නේ,
(1) අප නිරතුරුව දෙව්මැදුරෙහි රැඳී සිටිය යුතු බවයි.
(2) දේව මාළිගාවේ පඬිවරුන් ඇසුරු කළ යුතු බවයි.
(3) දේව රාජ්‍යයේ මෙහෙවර හොඳින් වටහාගත යුතු බවයි.
(4) දේව මාළිගාවට යෑමෙන් පසු වැඩිහිටියකුසේ ක්‍රියා කළ යුතු බවයි.

08 ස්නාවක ජොහාන්තුමාගේ දේශනා අද සමාජයේ යථාර්ථයක් බවට පත් කිරීමට කිතුණු අප,
(1) සමාජයේ නායකයින් විවේචනය කළ යුතුය.
(2) ධනාත්මක සමාජ පරිවර්තනයකට දායක විය යුතුය.
(3) දුප්පතුන්ට මුදල් ලබාදිය යුතුය.
(4) එකිනෙකා අතර සමගිය ඇතිකිරීමට ක්‍රියා කළ යුතුය.

09 පහත සඳහන් ප්‍රකාශ අතුරින් ස්නාවක ජොහාන්තුමා සාමාන්‍ය ජනතාවට අවධාරණය කළේ,

A කෑම ඇති අය නැති අයට දෙත්වා.

B නියමිත පමණට වඩා වැඩියෙන් බදු අය නොකරන්නී

C අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා.

D ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්නී

(1) A හා C ය. (2) B හා C ය. (3) A හා D ය. (4) B හා C යී

10 හෙරෝද් රජු විසින් ස්නාවක ජොහාන් සිරගත කරනු ලැබුයේ,

(1) මනස්ථාපනයේ පණිවිඩය ජනතාවට දුන් නිසාය.
(2) නීතිරීති තද වැඩි බව ප්‍රකාශ කළ නිසාය.
(3) හෙරෝද්ගේ දුෂ්ටකම ගැන තරවටු කළ නිසාය.
(4) රෝම අධිරාජ්‍යයාට විරුද්ධව ක්‍රියා කළ නිසාය.

11 ජේසුස් වහන්සේ තම සේවය පිළිබඳ ප්‍රථමයෙන් ප්‍රකාශ කළ අවස්ථාව වූයේ,

(1) මුල් ගෝලයින් කැඳවූ අවස්ථාවේදී ය. (2) නාසරෙත්හි සිනගෝගයේදී ය.
(3) කන්ද උඩ දේශනාවේදී ය. (4) සකෙවුස්ගේ නිවසේදී ය.

12 ජේසුස් වහන්සේ විසින් අන්‍ය ජාතීන්ට ද දේව රාජ්‍යය විවෘත බව අවධාරණය කරනු ලැබුයේ,

(1) ජෙරුසලම් දේව මාළිගාවේ දී ය. (2) ගෙනසරත් විල අසලදී ය.
(3) මිටියාවතේ දේශනාවේදී ය. (4) නාසරෙත්හි ධර්මශාලාවේදී ය.

13 ජේසුස් වහන්සේ පවුල් සංකල්පයට නව අරුතක් ගෙන දුන්නේ,

(1) ගෝලයින්ට පවුලේ යාච්ඤාව ඉගැන්වීමෙන් ය.
(2) වයස අවුරුදු 12 දී දෙමව්පියන්ට අවනතවීමෙන් ය.
(3) දෙව්මැදුරේ මා සිටිය යුතු බව නොදන්නෙහි ද ඇසීමෙන් ය.
(4) මගේ වචන අසා එය පිළිපදින්නන් මාගේ මෑණියන් සහ සහෝදරයන් ලෙස පැවසීමෙන් ය.

14 ''දියඹට ගොස් දැල් හෙලන්න'' යනුවෙන් ජේසුස් වහන්සේ පැවසුවේ,

(1) සීමොන්ට ය. (2) ජාකොබ්ට ය. (3) අන්ඩෲට ය. (4) ජොහාන්ට යී

15 ''මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද ගලවා ගන්නට ද වැඩම කළ සේක.'' මෙසේ ප්‍රකාශ කරනු ලැබුයේ,

(1) ලෙවි කැඳවීමේදී ය. (2) පරිසිවරයාගේ නිවසේදී ය.
(3) සකෙවුස්ගේ නිවසේදී ය. (4) ගලීල මුහුද අසලදී ය.

16 ජේසුතුමා ජයාන්විතව කොටළුවකු පිට ජෙරුසලම් දේවමාළිගාවට යෑම මගින් පන්නරය ලබන කිතුණුවා

(1) අභිමානයෙන් ක්‍රියා කළ යුතුය.
(2) සාමයෙන් සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතුය.
(3) ජය ඝෝෂා කරමින් පෙරහැරේ යා යුතුය.
(4) වීර ලීලාවෙන් ක්‍රියා කළ යුතුය.

17 ''පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න.'' යනුවෙන් ජේසුතුමා පැවසුවේ,

(1) ජෙරුසලම් දේවමාළිගාවේදී ය. (2) ගෙත්සමන උයනේදී ය.
(3) සකෙවුස්ගේ නිවසේදී ය. (4) කුරුසිපත් කරන අවස්ථාවේ දී ය.

18 අද සමාජයේ යුක්තියට පිටුපා තම ජනප්‍රියතාවය ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කරන අය සමාන වන්නේ,

(1) පිලාත් ආණ්ඩුකාරයාට ය. (2) ස්නාවක ජොහාන්ට ය.
(3) හෙරෝද් රජතුමාට ය. (4) උත්තම පූජකතුමාට ය.

19 ජේසුස් වහන්සේ කුරුසියේ දිවි පිදූ අවස්ථාවේදී සොබාදහම දැක්වූ පුදුමාකාර ප්‍රතිචාර වූයේ,

(1) වැස්ස ඇතිවීමයි. (2) හිරු දීප්තිමත්ව බැබලීමයි.
(3) අන්ධකාර වී වැස්ස වැසීමයි. (4) රටපුරා අන්ධකාරවී හිරු අඳුරුවීමයී

20 පේදුරුගේ මහා ප්‍රකාශය වන්නේ,
   (1) ''ඔබගේ වචනය ලොව සීමා දක්වාගෙන යම් යන්නයි.''
   (2) ''ඔබ සමග මරණයට යැමට වුවද සූදානම්ය යන්නයි.''
   (3) ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝමය යන්නයි.''
   (4) ''ඔබ දෙවියන් වහන්සේගේ දිව්‍යසිවරයාණෝය යන්නයි.''

21 ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යාමට උදව් වූයේ,
   (1) අරමාතියේ සීමොන් ය. (2) කිරේනියේ ජෝසෙප් යි
   (3) අරමාතියේ ජෝසෙප් ය. (4) කිරේනියේ සීමොන් යි

22 හිස් වූ සොහොන මගින් එළිදරව් වන සත්‍ය වන්නේ,
   (1) ජේසුස් වහන්සේ කුරුසිපත් වූ බවයි. (2) ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණ වූ බවයි.
   (3) ජේසුස් වහන්සේ දුක්විඳි බවයි. (4) ජේසුස් වහන්සේ උත්ථාන වූ බවයි.

23 ව්‍යවස්ථාවත්, අනාගත වාක්‍යයත් ජේසුතුමා මගින් සම්පූර්ණ වූ බව අනාවරණය වූයේ,
   (1) ජේසුතුමා බෞතීස්මය ලැබූ අවස්ථාවේදී ය.
   (2) ජේසුතුමා ගෝලයින්ට දර්ශනය වූ අවස්ථාවේදී ය.
   (3) ජේසුතුමා රූප විපර්යාසය අත්දුටු අවස්ථාවේදී ය.
   (4) ජේසුතුමා කුරුසිපත් කළ අවස්ථාවේදී ය.

24 දේව රාජ්‍යයේ වර්ධනය දේව බලයෙන් සිදුවන බව අපට අවධාරණය කරනුයේ,
   (1) දැල පිළිබඳ උපමාවයි. (2) මුහුන් පිළිබඳ උපමාවයි.
   (3) වපුරන්නාගේ උපමාවයි. (4) නැතිවූ බැටළුවා පිළිබඳ උපමාවයි.

25 දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ජනතාවට ප්‍රකාශ කිරීමට ජේසුස් වහන්සේ භාවිතා කළ උපමා වන්නේ,
   (1) අයකැමියා සහ පරිසිවරයා හා නැතිවූ බැටළුවා උපමාව ය.
   (2) මහ මංගල භෝජනය හා අබ ඇටයේ උපමාව ය.
   (3) නැත්වූ කාසිය හා අබ ඇටයේ උපමාව ය.
   (4) මහ මංගල භෝජනය හා නැතිවූ කාසිය උපමාව ය.

26 ''යහපත් සමාරිතයා'' උපමා කථාවෙන් අපට අවධාරණය කරනු ලබන්නේ,
   (1) අපගේ අසල්වැසියා පිළිබඳව ය. (2) සමාරිත ජාතීන් පිළිබඳව ය.
   (3) ජුදෙව්වන් පිළිබඳව ය. (4) අන්‍යජාතීන් පිළිබඳව ය.

27 යම්කෙනෙකු තමා අන් අයට වඩා උසස් යැයි අධිතක්සේරු කර ගැනීමේ අවදානම පෙන්වා දෙන උපමාව වන්නේ,
   (1) ධනපතියා සහ ලාසරස් ය. (2) පොහොසත් මෝඩයා ය.
   (3) පරිසිවරයා සහ අයකැමියා ය. (4) යහපත් සමාරිතයා ය.

28 ''ඔබේ ඉඟ පටිය බැඳ ගන්න. පහන් ද දල්වා තබා ගන්න.'' මෙම ප්‍රකාශයෙන් අවධාරණය කරනුයේ,
   (1) දැනුම් දෙනතුරු බලා සිටිය යුතු බවයි. (2) ක්‍රියා කිරීමට සූදානම් බවයි.
   (3) නිරතුරුවම සූදානමින් සිටිය යුතු බවයි. (4) ඉවසීමෙන් බලා සිටිය යුතු බවයි.

29 නිරතුරුව පෞද්ගලික යාච්ඤාවේ යෙදෙන තැනැත්තාට
   A ලෙඩ දුක් කරදරවල දී දෙවිඳුන් පිහිට පැතිය හැකිවේ.
   B ජීවිතයේ දී සැපත හා සැනසීම නිහතමානීව විඳිය හැකිවේ.
   C ජීවිත ප්‍රශ්න හා අභියෝගවලට ශක්තිය නැතිවේ.
   D දෙවියන්වහන්සේ තමා සමග වැඩසිටින බව අවබෝධ වේ
   (1) A, C, D ය. (2) B, C, D ය. (3) A, B, C ය. (4) A, B, D යි

30 අප ජීවිත ගමනේ දී අපට මුහුණදීමට සිදුවන පරීක්ෂාවන්වලදී ක්‍රියා කළ යුත්තේ,
   (1) දේවස්ථානයට ගොස් යාච්ඤා කිරීමයි. (2) ශුද්ධාත්ම මගපෙන්වීම සෙවීමයි.
   (3) පරීක්ෂාවන් මගහැරීමයි. (4) දේව රාජ්‍යය සෙවීමයි.

31 කිතුණුවන් වන අප විසින් සිදුවන වැරදි පිළිබඳ පසුතැවී අලුත් ජීවිතයක් ඇරඹීමට තමා තුළ ඇති කරගත යුතු ගුණාංගයක් වන්නේ,

(1) මනස්ථාපනය වීම ය. (2) කමාව ලැබීම ය.

(3) දයාව පෙන්වීම ය. (4) ප්‍රේමය දැක්වීම ය.

32 අනුන් වෙනුවෙන් ඔබට වැයවීමට, ක්‍රියාත්මක වීමට හැකි අවස්ථාවක් වන්නේ,

(1) මනස්තාපනය වීම ය. (2) කමාව ලැබීම ය.

(3) දයාව පෙන්වීම ය. (4) ප්‍රේමය දැක්වීම ය.

33 A වනාන්තරයේ සිටියදී උන්වහන්සේට බඩගිනි දැනුනි.

B ගෙත්සෙමනෙදී උන්වහන්සේට දුක සහ දෙව්නාව දැනුනි.

C කුරුසිගසේ දී උන්වහන්සේට පිපාසය දැනුනි.

ඉහත අවස්ථා මගින් ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් ගම්‍ය වන්නේ,

(1) උන්වහන්සේගේ දේවත්වයයි. (2) උන්වහන්සේගේ සහභාගීත්වයයි.

(3) උන්වහන්සේගේ මනුෂ්‍යත්වයයි. (4) උන්වහන්සේගේ සහෝදරත්වයයි.

34 ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව අප වටා සිටින අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන ඕනෑම කෙනෙකු අපගේ ................................................................ වේ.

මෙහි හිස්තැනට සුදුසු වචනය තෝරන්න.

(1) සහෝදරයා (2) නෑදෑයන් (3) හිතමිතුරා (4) අසල්වැසියා

35 ජෙරුසලම් දේව මාළිගාවේ ප්‍රධානත්වය ගෙන ක්‍රියා කළේ,

(1) එසෙනිවරු ය. (2) පරිසිවරු ය. (3) සද්දුසිවරු ය. (4) සෙලෙට්වරු ය.

36 කිතුණුවන් වන අප ජේසුස් වහන්සේගේ රැළට එකතුවිය යුත්තේ,

(1) සමාජයේ කැපීපෙනීමට ය. (2) දේව රාජ්‍ය උරුමකර ගැනීමට යි

(3) දරුවන් පාසලට දැමීමට ය. (4) ආධාර ලබාගැනීමට ය.

37 ''දැන් කඳුළු හෙලන ඔබ භාග්‍යවන්තයෝ ය. මන්ද ඔබ ......................................................'' මෙම ප්‍රකාශය සම්පූර්ණ වන පිළිතුර වන්නේ,

(1) සිනාසෙනු ඇත. (2) තෘප්තිමත් වනු ඇත.

(3) සැපවත් ජීවිතය විඳ හමාරය. (4) දේව රාජ්‍ය දකිනු ඇත.

38 කිතුණු ජීවිතයට ප්‍රබල ශක්තියක් වන්නේ,

(1) ශුද්ධ ලියවිලි ය. (2) රොටී කැඩීම ය.

(3) සහජීවනය ය. (4) යාච්ඤාව ය.

39 ශ්‍රී ලංකාවේ වර්තමාන අර්බුධකාරී ජීවන රටාව තුළ ජීවත් වන කිතුණුවා

(1) උද්ඝෝෂණ කළ යුතුය. (2) ඉවසීමෙන් ක්‍රියාකළ යුතුය.

(3) සහනාධාර බලාපොරොත්තු විය යුතුය. (4) විදේශගත විය යුතුය.

40 දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වනුයේ,

(1) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමයි. (2) ජේසුස් වහන්සේට සේවය කිරීමයි.

(3) ජේසුස් වහන්සේගේ ලොව පහළවීමයි. (4) ජේසුස් වහන්සේගේ උත්ථානයයි.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය - 2022

10 ශ්‍රේණිය

## ක්‍රිස්තියානි ධර්මය - II

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01 පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(1) ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ අනාවැකි පලකළ දිවැසිවරුන් දෙදෙනා කවුරුන් ද?

(2) (අ) මෙසියස් යන්නෙහි අර්ථය කුමක් ද?

(ආ) පැමිණෙන්න සිටින තැනැන්වහන්සේගේ පිළිබිඹු වූ ගුණාංග දෙකක් පෙන්වා දෙන්න.

(3) නාසරෙත්හි සිනගෝගයේ දී ජේසුස් වහන්සේ තමන් ප්‍රතික්ෂේප කරනු ලැබූ දිවැසිවරයා බව ජනතාවට දැනෙන්න ඉදිරිපත් කළ ප්‍රස්ථා පිරුළු දෙක ලියා දක්වන්න.

(4) ජේසුස් වහන්සේ විසින් සිදුකළා වූ මරණින් උත්ථාන කිරීම් දෙකක් පෙන්වා දෙන්න.

(5) ජේසුස් වහන්සේ මුලින්ම කැඳවූ ශ්‍රාවකයන් තුන්දෙනා කවුරන් ද?

(6) ජේසුස් වහන්සේට විරුද්ධව පිලාත් ඉදිරියේ ඉදිරිපත් කළ චෝදනා දෙකක් ලියන්න.

(7) ජේසුස් වහන්සේ ආබ්‍රහම්ගේ දියණිය හා ආබ්‍රහම්ගේ පුත්‍රයා ලෙස හඳුන්වනු ලැබුයේ කවුරුන් ද?

(8) දෙවියන්වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ඔබට කළහැකි දේවල් 2 ක් ලියන්න.

(9) ''ජීවමාන තැනැන්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද?'' මෙසේ පැවසුවේ කවුරුන් විසින් කාහට ද?

(10) ජේසුස් වහන්සේ ජුදා සමාජයේ දරුවන්ට නිසි ගෞරවයක් හා පිළිගැනීමක් ලබාදීමට ක්‍රියා කළ අවස්ථා දෙකක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2 x 10 = 10)

02. ''නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේ පරීක්ෂා නොකරන්න.''

(1) මෙම වදන ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ අවස්ථාව ඉදිරිපත් කරන්න.

(2) වර්තමාන සමාජයේ ඔබට මුහුණදීමට සිදුවන පරීක්ෂා තුනක් ලියා දක්වන්න.

(3) ඔබට එල්ලවන පරීක්ෂාවලදී ඔබ ක්‍රියාකරන අයුරු කරුණු පහකින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2+3+5= 10)

03. (1) ජෙරුසලම් දේව මාළිගාවේ දී ජේසු බිළිඳා මෙසියස් ලෙස හඳුනාගනු ලැබුයේ කවුරුන් විසින් ද?

(2) ''මා පියාණන්ගේ මැඳුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?'' ජේසුතුමාගේ මෙම ප්‍රකාශයේ අර්ථය කුමක් ද?

(3) වර්තමාන සමාජය තුළ කිතුණු ආගමික විශ්වාසයන් හා චාරිත්‍ර වාරිත්‍රවල ඇති වටිනාකම් කරුණු පහක් මගින් ලියා දක්වන්න.

(ලකුණු 2+3+5= 10)

04. (1) ස්නාවක ජොහාන්තුමාගේ කාලය තුළ එවකට සිටි උත්තම පූජකතුමා කවුරුන් ද?

(2) ස්නාවක ජොහාන්තුමා අනුශාසනා කළ ජන කණ්ඩායම් පෙන්වා දී ඔවුන් එකිනෙකාට කළ අනුශාසනා පෙන්වා දෙන්න.

(3) ස්නාවක ජොහාන්ගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගතහැකි ආදර්ශයන් පහක් පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5= 10)

05. (1) ජේසුස් වහන්සේ සිය සේවය ඇරඹුයේ කුමන නගරයකින් ද? ධර්මශාලාවේ දී උන්වහන්සේ කියැවූයේ කුමන දිවැසිවර ග්‍රන්ථය ද?

(2) ජේසුස් වහන්සේ කියැවූ පාඨයේ අඩංගු කරුණු තුනක් ඉදිරිපත් කරන්න.

(3) වත්මන් සමාජයේ දක්නට ලැබෙන එවැනි අවස්ථා ඉදිරිපත් කර කිතුණු අපට ගත හැකි ක්‍රියාමාර්ග පහදන්න.

(ලකුණු 2+3+5= 10)

06. (1) ජුදා සමාජයේ සිටි ප්‍රධාන ආගමික කණ්ඩායම් දෙක නම් කරන්න.

(2) ජුදා ආගමික කණ්ඩායම් ජේසුස් වහන්සේ වෙත ඉදිරිපත් කළ අභියෝග හා ප්‍රශ්නවලට දැක්වූ ප්‍රතිචාර ලියා දක්වන්න.

(අ) සබත් දින සුවකිරීම පිළිබඳ අභියෝගය

(ආ) පව්කරුවන් ඇසුරු කිරීම පිළිබඳ අභියෝගය

(ඉ) පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්නය

(3) ජුදා ආගමික කණ්ඩායම් සමග ඇති වූ සංවාදවල දී ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරවලින් කිතුණු අපට අවධාරණය කරනුයේ කුමන ගුණාංග ද?

(ලකුණු 2+3+5= 10)

07. පහත මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (සැකිල්ල පිළිබඳ සැලකිලිමත් වන්න.)

(1) එම්මාවුස් ගමන

එම්මාවුස් ගමනට සහභාගි වූවන් / ඔවුන් කථාකළ දේ / අමුත්තා ඔවුන්ට පැහැදිලි කළ දේ / ජේසුස් වහන්සේ හඳුනාගත් ආකාරය / ඔවුන්ගේ ප්‍රතිචාරය

(2) ධර්මදූත සේවය

සහභාගී වූ කණ්ඩායම් / ඔවුන්ට දුන් උපදෙස් / ඔවුන්ට පැවරූ කාර්යය / මෙම චාරිකාවලින් අවධාරණය වන දේ / ධර්මදූත චාරිකාවල ප්‍රතිඵල

(3) යාච්ඤාව

යාච්ඤාව යනු හැඳින්වීම / ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා / යාච්ඤා කිරීමට ජේසුස් වහන්සේ දුන් උපදෙස් / යාච්ඤා කිරීමට ජේසුස් වහන්සේ ඉගැන් වූ ආකාරය / ඔබ යාච්ඤා කරන අවස්ථා

(4) රාජ තේජසින් ජෙරුසලමට පිවිසීම

කුමන දිවැසිවරයාගේ ප්‍රකාශයක් ඉටුවීමක් ද? / ජයග්‍රාහී පැමිණීම / ජනතාව හා ජුදෙව් නායකයින්ගෙන් පැමිණි අභියෝග / දේව මාළිගාව පවිත්‍ර කිරීම කළ ආකාරය / දේව මාළිගාව පවිත්‍ර කිරීමේ දී පැවසූ වදන්

(ලකුණු 2 x 5= 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 4 ) | 04. ( 1 ) | 05. ( 1 ) | 06. ( 4 ) | 07. ( 3 ) | 08. ( 2 ) | 09. ( 1 ) | 10. ( 3 ) |
| 11. ( 2 ) | 12. ( 4 ) | 13. ( 4 ) | 14. ( 1 ) | 15. ( 3 ) | 16. ( 2 ) | 17. ( 2 ) | 18. ( 1 ) | 19. ( 4 ) | 20. ( 3 ) |
| 21. ( 1 ) | 22. ( 2 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 4 ) | 26. ( 1 ) | 27. ( 3 ) | 28. ( 3 ) | 29. ( 4 ) | 30. ( 2 ) |
| 31. ( 1 ) | 32. ( 2 ) | 33. ( 3 ) | 34. ( 4 ) | 35. ( 3 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 4 ) | 39. ( 2 ) | 40. ( 1 ) |

(ලකුණු 40)

## II පත්‍රය

01. (1) යෙසායා සහ මීකා
(2) අලේපලත් තැනැත්තා / යුක්තිය ඉටුකිරීම හා ධර්මිෂ්ඨකම
(3) ''වෙදතුමාණෙනි ඔබ ම සුව කරගන්න.'' / ''ගමේ දිවැසිවරයා ගමට අගේ නැත.''
(4) නායින් නුවර වැන්දඹුවගේ පුත්‍රයා උත්ථාන කිරීම / ජායිරස්ගේ දියණිය උත්ථාන කිරීම.
(5) පේදුරු, ජාකොබ්, ජොහාන්
(6) ජාතිය කැරලි ගැසීමට පෙළඹවීම / අධිරාජ්‍යයට බදු ගෙවීම තහනම්කිරීම / තමා ක්‍රිස්තුස් නම් රජකු බව ප්‍රකාශ කිරීම
(7) ආබ්‍රහම්ගේ දියණිය - කුදු ස්ත්‍රිය / ආබ්‍රහම්ගේ පුත්‍රයා - සකෙවුස්
(8) යාච්ඤා කිරීම / දේව වචනය කියවීම
(9) දේවදූතයා විසින් සොහොන වෙත පැමිණි කාන්තාවන්ට ය. (මග්දලායේ මරියා / ජාකොබ්ගේ මව් මරියා ජොවන්නා)
(10) ශ්‍රේෂ්ඨත්වය පෙන්වීමට කුඩා දරුවකු ගෙනහැරපෑම / ළදරුවන් මාවෙතට එන්න ඉඩහරින්න යනුවෙන් පිළිගැනීම / දරුවන්ට පීඩා කරන්නන් ඇඹරුම් ගලක් බෙල්ලේ ගටගසා මුහුදට දැමීම සුදුසු බව පෙන්වා දීම.

02. (1) ජේසුස් වහන්සේට පැමිණි තුන්වන පරීක්ෂාව දේව මාළිගයේ කොත මුදුනින් පනින්න යැයි පැවසූ අවස්ථාව
(2) • අල්ලස් ලබා ගැනීම • බලය තනතුරු ලබා ගැනීම • ඉගෙන ගන්න දරුවන් හට ඊර්ෂ්‍යා කිරීම වැනි ලියා ඇති පිළිතුරු සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න
(3) • අධ්‍යාත්මික දේවලට නැඹුරු වීම • යාච්ඤාවෙන් පිළිතුරු සෙවීම • ශු. බයිබලය අධ්‍යයනය කිරීම • දේවරාජ්‍යයේ ගුණධර්ම වන ප්‍රේමය නිහතමානී කම යටහත් පහත් කම අනුව ක්‍රියා කිරීම • තරඟය වෙනුවට අන් අය සමඟ සහෝදරත්වයෙන් ක්‍රියා කිරීම වැනි ලියා ඇති පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න

03. (1) සිමියොන් සහ අන්නා
(2) * ජේසුතුමා දෙවියන්වහන්සේ තම පියාණන් බව හඳුනාගෙන ප්‍රකාශ කිරීම.
* ළමා කාලයේ සිටම දේව රාජ්‍යයේ මෙහෙවර පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම.
* නමස්කාරික ජීවිතය යොමුවීම.
(3) * එකම දෙවියන් වහන්සේ විශ්වාස කිරීමෙන් ඇදහිල්ලෙන් ක්‍රියා කිරීමට හැකිවේ.
* බෞතීස්මය ලැබීමෙන් දේව ප්‍රසාදය ඇතිව ජීවත්වීමට හැකිවේ.
* සහභාගිකම මගින් සහෝදරත්වය, එකමුතුකම වර්ධනය වීම.
* නමස්කාරික ජීවිතය නිසා සතුටින් සිටීමට හැකිවීම.
ෘ යාච්ඤාව මගින් සියල්ල දරාගත හැකිවන අතර ශක්තිමත්ව ජීවත්වීමට හැකිවීම.

04 (1) කයාපස් යී
(2) * පොදු ජනතාව - ''අදනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා''
''කෑම ඇති අය නැති අයට දෙත්වා''
* රාජ්‍ය සේවයේ යෙදී සිටි අය (අයකැමියන්) - ''නියමිත පමණට වැඩියෙන් අයබදු අයනොකරන්න''
* ආරක්ෂක අංශය (අයකැමියන්) - කිසිවෙකුගෙන් කිසිවක් බලහත්කාරයෙන් පැහැර නොගන්න. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න.''
(3) * යුක්තිගරුක ජීවිතයක් සඳහා ක්‍රියා කිරීම. * අවශ්‍යතා ඇති අයට උදව් කිරීම.
* රැකියාව තුළ අවංක සේවයක් කිරීම. * ඇදහිල්ලේ ජීවිතයක් ගත කිරීම.
* අයහපත් ක්‍රියාවන්වලට යොමුවන විට මනස්ථාපනයේ පණිවිඩය සිහිපත් කිරීම.

05 (1) සේවය ගලීලයේ නාසරත් නුවරින් ඇරඹීය. යෙසායා දිවැසිවර ග්‍රන්ථය.
(2) දුප්පතුන්ට ශුභාරංචිය / වහලුන්ව මිදීම / පීඩිතයින්ට ගැළවීම / අන්ධයින්ට පෙනීම
(3) දුප්පත් අය - ඔවුන්ගේ අවශ්‍යතාවන්ට පිහිටවීමෙන් සුබසෙත ක්‍රියාත්මක කිරීම.
පීඩිතයින් - ඔවුන් වෙනුවෙන් හඬක් නැගීම, සහන සැලසීම.

**පිළිතුරු පත්‍රය - II පත්‍රය - ඉතිරි කොටස**

වහලුන් - පුනරුත්ථාපනය කිරීම, මතට, වැරදි ක්‍රියාවල යෙදෙන්නන් ඉන් මිදීම
අන්ධයින් - දේව වචනයට අන්ධව සිටින අයට ඉන් මිදීමට මඟ පෙන්වීම / ස්වාමීන් වහන්සේ තුළ සැනසීම අත්දැකීමට හැකි බව පෙන්වාදීම.

06 (1) පරිසිවරු / සද්දුසිවරු

(2) (අ) සබත් දින සුවකිරීම් - සබත් දිනයේ අප කළ යුත්තේ යහපත ද, අයහපත ද,
(ආ) පව්කරුවන් ඇසුරු කිරීම - රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් කම් නැත.
(ඉ) පුනර්ජීවනය පිළිබඳ - පුනර්ජීවනයට පැමිණීමට වරම් ලද්දෝ අවාහ විවාහවන්නේ නැත.

(3)
* නීතියට වඩා මිනිස්කම උතුම් බව
* සබත් දිනයේ වුවද යහපතට නැඹුරුවිය යුතු බව
* සමාජයේ කොන්වූවන්ට දයානුකම්පාව දැක්විය යුතු බව
* නොමඟ ගිය අය පිළිගනිමින් නිවැරදි මඟ කියාදීම
* පුනර්ජීවනය ඇති බවත් ඒ සඳහා වරම ලබාගැනීම වැදගත් බවත්

07 (1) එම්මාවුස් ගමන
* ක්ලෙයපත් හා තවත් ගෝලයෙක්
* ජේසුස් වහන්සේ මරණයට පත්වීම, එම නිසා ශ්‍රාවකයින්ගේ සිත් බිඳ වැටී ඇති බව
* ජීවමාන ජේසුස්වහන්සේ මෝසෙස් හා සියලු දිවැසිවරුන්ගෙන් පටන්ගෙන තමන්වහන්සේ පිළිබඳ මුළු ශුද්ධ ලියවිල්ලේ සඳහන් කරුණු පහදා දීම.
* ශ්‍රාවකයන් සමග නතරවී රොටි කැඩූ අවස්ථාවේදී ජේසුස්වහන්සේ සියසින් දැක ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම.

(2) ධර්මදූත සේවය
* ශ්‍රාවකයන් දොළොස්දෙනා හා ධර්මදූතයින් 70 දෙනා
* මිල මුදල්, ඇඳුම්, පාවහන්, මල්ලක් නොගෙන යන්න. පිළිගන්න අය සමග නතරවන්න. නොපිළිගන්නා අයගෙන් පාදවල දූලි පවා ගසා දමන්න.
* අවධාරණය කරනුයේ සුබහස්න ප්‍රමාද නොවී ප්‍රකාශ කරන්න. ධර්මදූත සේවයේදී පීඩා හා අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව, චාම් දිවිපෙවතක්, දෙවියන්වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය රැඳවීම.
* ධර්මදූත සේවය මිලකළ නොහැකිය. සාම පැතුම ගැබ්ව පැවතීම.
* ප්‍රතිඵල - රටපුරා සුබඅස්න ප්‍රකාශ වීම / රෝගීන් සුව කිරීම / දුෂ්ට ආත්ම යටපත් වීම.

(3) යාච්ඤාව
* දෙවියන් වහන්සේ සමග සම්බන්ධ වන මාර්ගය
* තම සේවය ඇරඹීමට පෙර පාළුකරයේ දින 40 ක්, ශ්‍රාවකයන් තෝරාගැනීමට පෙර, භාස්කම් කිරීමට පෙර, පන්දහසකට කෑම දීමට පෙර, ගෙත්සමන උයනේදී
* ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව
* ලෙඩදුක් වූ විට, උදය අවදිවීමෙන් පසු, රාත්‍රී නින්දට යෑමේදී, කෑමට පෙර

(4) රාජ තේජසින් ජෙරුසලමට පිවිසීම.
* සෙකරියා දිවැසිවරයා
* ජයන්විත ව ජෙරුසලමට පිවිසෙන ජේසුස් වහන්සේ ඒ සඳහා ''නැවුම්'' කොටළු නාම්බකු ගෙන්වා ගැනීම.
* ජනතාව මෙසියස්වරයාණෝ මෙතුමාණෝ යන අපේක්ෂාවෙන් ඔල්වරසන් දෙමින් කෑඳවාගෙන යෑම.
* ජේසුස් වහන්සේ හැසුරුණ ආකාරය නිසා තමන් අභිබවා යනු ඇතැයි ජුදෙව් ජන නායකයින් බියවීම.
* ''මාගේ ගෘහය යාච්ඤාවේ ගෘහයක් යැයි ලියා ඇත. එය ඔබ හොරුන්ගේ ගුහාවක් කර තිබේ.'' පවසා වෙළඳුන් පළවා හැරීම.